සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, 2020

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2020

## I පත්‍රය

පැය එකයි.

විභාග අංකය ......................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**


| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කේත අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය. | V/I/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

● පහත ඇති රූප නිරීක්ෂණය කර අංක **1** සහ **2** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**1.** කොටුව තුළ ඇති චිත්‍රයට වඩාත් සමාන වන සේ ඇඳ ඇති චිත්‍රය කුමක් ද?






(1)


(2)


(3)

**2.** A රූපයට සමාන රූපයක් ලබා ගැනීම සඳහා B රූපයේ සිදු කළ යුතු වෙනස්කම් ගණන කීය ද?



A රූපය


B රූපය

(1) 2 (2) 3 (3) 5


● අංක **3** සහ **4** ප්‍රශ්නවල, කොටුව තුළ ඇති කාණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූපය කුමක් ද?




**3.**




(1)  (2)  (3) 


**4.**



(1)  (2)  (3) 

**5.** මෙම රූපය නිවැරදිව සම්පූර්ණ කිරීමට කුමන රූප කැබැල්ල සම්බන්ධ කළ යුතු ද?




(1)  (2)  (3) 

[තුන්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK


**6.** කොටුව තුළ ඇති රූප බලන්න.




එම රූප කැබලි තුන ම එකතු කර සැකසිය හැකි තනි රූපය කුමක් ද?



(1)




(2)




(3)

**7.** රූපවලින් දක්වා ඇති අවස්ථා තුන අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?





(1) A, B, C (2) A, C, B (3) C, A, B


**8.** 

හිස් කොටුවට වඩාත් ගැළපෙන රූපය තෝරන්න.


(1)  (2)  (3) 

**9.** කොටුව තුළ ඇති රූප පේළියේ ඊළඟට යෙදිය යුතු රූපය කුමක් ද?






(1)



(2)




(3)



[හතරවැනි පිටුව බලන්න.

PADANAMA PUBLICATION


+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**10.** 


මෙම කාඩ්පත් හතර ඒවායේ ඇති රෝම ඉලක්කම්වල ආරෝහණ පටිපාටිය අනුව තැබූ විට රූප පිහිටන අනුපිළිවෙළ කුමක් ද?


(1)  (2)  (3) 

**11.** දී ඇති රටාවෙහි හිස්කොටුවට ගැළපෙන පිළිතුර කුමක් ද?




(1)  (2)  (3) 

**12.** 966,999 හා 39765 යන සංඛ්‍යා හරහටත් 389 හා 796 යන සංඛ්‍යා පහළටත් ලැබෙන පරිදි කොටුදැල සම්පූර්ණ කළ විට එහි හතරවන තීරයේ පහළට ලැබෙන සංඛ්‍යාව කුමක් ද?



(1) 59 (2) 66 (3) 69

**13.** පහත දී ඇති රූප දෙක විනිවිද පෙනෙන කඩදාසි දෙකක ඇඳ ඇත.



1 රූපය



2 රූපය

රූප දෙකෙහිම C සලකුණු එක මත එක පිහිටන සේ එක් කඩදාසියක් මත අනෙක තැබූ විට ලැබෙන රූපය කුමක් ද?

(1) 


(2) 


(3) 



**14.** දින 31 ක් ඇති එක්තරා මාසයක පළමුවැනිදා සඳුදා දවසකි. එම මාසයේ 31 වැනිදා,

(1) අඟහරුවාදා දවසකි. (2) බදාදා දවසකි. (3) බ්‍රහස්පතින්දා දවසකි.

**15.** සේන, උදෑසන 6.00 සිට දහවල් 12.00 තෙක් ද පාල එතැන් සිට සවස 5.00 තෙක් ද දයා එතැන් සිට රාත්‍රි 8.00 තෙක් ද වැඩක නිරත වූහ. ඔවුන් තිදෙනා එම වැඩෙහි නිරත වූ කාලය ප්‍රමාණාත්මකව දක්වා ඇති පිළිතුර කුමක් ද?

(1) 



(2) 


(3) 


[පස්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228
WWW.PADANAMAPUBLICATION.LK

**16.** පහත රූපයේ තිබෙන ත්‍රිකෝණ සංඛ්‍යාව කීය ද?



(1) 5 (2) 6 (3) 7

**17.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 3 | 7 | 4 | 5 | 2 | 6 |

මෙහි දැක්වෙන ඉලක්කම් හත ආරෝහණ පටිපාටියට සැකසීම සඳහා ඉලක්කම් කීයක පිහිටීම් වෙනස් කළ යුතු ද?


(1) 3 (2) 4 (3) 5


**18.** මෙම රූපයේ ඇති හිස් කොටුවට ගැළපෙන සංඛ්‍යාව කුමක් ද?

| | | | |
|---|---|---|---|
| 1 | 2 | 3 | 6 |
| 3 | 6 | 12 | 3 |
| 4 | 8 | | 5 |
| 3 | 1 | 5 | 5 |

(1) 14 (2) 15 (3) 16

**19.** පහත රූපයෙහි ඇති හිස් කොටස පිරවීමට සුදුසු කොටස් අයත් පිළිතුර කුමක් ද?



(1) 

(2) 

(3) 

**20.** අංක [01], [02] ආදි වශයෙන් [50] තෙක් අංක ලිවීමේදී 0 ඉලක්කම යෙදෙන වාර ගණන කීය ද?

(1) 7 (2) 13 (3) 14

**21.** පන්ති තුනක සිටින ශිෂ්‍ය සංඛ්‍යා 36, 37 සහ 38 වේ. ඉන් එක් පන්තියක පිරිමි ළමයින් සංඛ්‍යාවට වඩා ගැහැනු ළමයි තුන්දෙනෙක් වැඩියෙන් සිටිති. එම පන්තියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කීය ද?

(1) 36 (2) 37 (3) 38

**22.** පහත ඇති කවියෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද?


සීමා දැනගෙන එහෙ මෙහෙ යන්නේ
සතුටෙදි දුකේදි නිතර තෙමෙන්නේ
අනතුරකට නම් නෑ ඉඩ දෙන්නේ
දොරටු දෙකෙන් ඉක්මනට වැසෙන්නේ

(1) ඇස (2) මුඛය (3) නාසය


[හයවැනි පිටුව බලන්න.

**23.** I රූපයෙහි අඳුරු කර ඇති කොටු පමණක් වැසෙන සේ II රූපය ඇලවූවහොත්, එවිට ලැබෙන සමචතුරස්‍ර කොටුදැලෙහි ඇති මුළු කොටු සංඛ්‍යාව කීය ද?

(1) 16
(2) 25
(3) 36




I රූපය      II රූපය

**24.** 

සමචතුරස්‍ර තහඩුවක මුලු හතරෙන්, රූපයේ අඳුරු කර දැක්වෙන පරිදි, කුඩා සමචතුරස්‍ර කොටස් හතරක් කපා ඉවත් කරනු ලැබේ. එවිට ඉතිරි වන කොටසේ වටේ දිග, මුලින් තිබූ තහඩුවේ වටේ දිගට,

(1) වඩා අඩු ය.    (2) සමාන ය.    (3) වඩා වැඩි ය.


**25.** 


මෙම රූපයේ ඇති දැතිරෝද දෙක, ඊතල මගින් දැක්වෙන පරිදි කැරකීමේදී එකිනෙක ස්පර්ශ වන කොටස් දෙකක ඇති ඉලක්කම සහ රූපය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.


(1) 2 සහ △
(2) 4 සහ 
(3) 6 සහ 

**26.** කඩදාසි පාර්සලයක් තදව සිටින සේ එය වටා රබර් පටියක් යොදා ඇති අයුරු රූපයේ දැක්වේ. එවිට රබර් පටිය, එහි මුල් දිග මෙන් දෙගුණයක් වන සේ ඇදී පවතී. පාර්සලයේ මිනුම් රූපයේ දී ඇත. රබර් පටියේ මුල් දිග කොපමණ ද?




(1) 12.5 cm    (2) 25 cm    (3) 50 cm




**27.** පහත ඇති සටහන බලන්න.




හිස් කොටුව සඳහා ගැළපෙන රූපය කුමක් ද?

(1)     (2)     (3) 


**28.** පන්තියක සිටි පිරිමි ළමයි හා ගැහැනු ළමයි මාරුවෙන් මාරුවට සිටින සේ පේළියක සිටියහ. පේළියේ මුලින් ම සිටියේ පිරිමි ළමයෙකි. නමුත් පේළිය අවසානයේ එක ළඟ ගැහැනු ළමයින් හතරදෙනකුට සිටීමට සිදු විය. පන්තියේ සිටි මුළු ළමයින් ගණන 45කි. එහි සිටි පිරිමි ළමයින් ගණන කීය ද?

(1) 20    (2) 21    (3) 22

[හත්වැනි පිටුව බලන්න.


+94 71 800 8533 / +94 77 088 2228
WWW.PADANAMAPUBLICATION.LK


**29.** දී ඇති කොටුදැලෙහි ආරම්භක කොටුවේ සිට අවසාන කොටුව තෙක් කොටුදැල තුළින් යා යුත්තේ අඳුරු කර ඇති කොටු මගහරිමිනි. කෙටිම මාර්ගයෙන් එසේ යාමේදී අතරමග කොටු කීයක් පසු කිරීමට සිදු වේ ද?





(1) 11
(2) 13
(3) 15


**30.** A රූපයේ දැක්වෙන හැඩයේ කඩදාසියක් කඩඉර දිගේ නමා B රූපයේ දැක්වෙන හැඩය ලබාගෙන, එහි දැක්වෙන කඩඉර දිගේ කපා කැබැලි කරන ලදී. ලැබුණු ත්‍රිකෝණාකාර කැබලි සංඛ්‍යාව කීය ද?


A රූපය


B රූපය

(1) 2 (2) 3 (3) 4


**31.** 

වන විට,  හි හිස් කොටුවට ගැළපෙන සංඛ්‍යාව කුමක් ද?

(1) 7 (2) 8 (3) 9

**32.** රාධා, සීතා, මීනා, කාසිම් සහ සුනිල් යන පස්දෙනා අතුරෙන්, රාධාට වඩා වයසින් බාල තිදෙනකු පමණි. කාසිම්ට වඩා වයසින් බාල දෙදෙනකු පමණි. සීතාට වඩා වයසින් බාල සුනිල් පමණි. වැඩිමහල්ම කවුරුන් ද?

(1) මීනා (2) රාධා (3) කාසිම්

**33.** 

රූපයේ දැක්වෙන්නේ සමාන ලී කුට්ටි සමූහයක් යොදාගෙන කර ඇති ගොඩනැගීමකි. ලොකු හරි හතරැස් ලී කුට්ටියක් ලැබෙන පරිදි මෙම ගොඩනැගීම සම්පූර්ණ කිරීමට තව කුඩා ලී කුට්ටි කීයක් අවශ්‍ය වේ ද?

(1) 5
(2) 8
(3) 9

**34.** මීටර සියය දිවීමේ තරගයක් පිළිබඳව A, B සහ C යනුවෙන් ප්‍රකාශ තුනක් පහත දී ඇත.


A : බිමල්ට පෙර අමල් තරගය නිම කළේ ය.
B : තරගකරුවන් හය දෙනකු තරගය නිම කළේ බිමල්ට පසුව ය.
C : තරගකරුවන් අට දෙනෙක් තරගයට සහභාගි වූහ.

තරගයේ පළමුවැන්නා කවුරුන්දැයි නිගමනය කිරීමට අවශ්‍ය ප්‍රකාශ මොනවා ද?

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C තුනම.

[අටවැනි පිටුව බලන්න.

- රූපයෙහි දැක්වෙන්නේ පාපැදිකරුවකු ආරම්භක ස්ථානයෙන් ගමන් අරඹා නැවත එම ස්ථානයට පැමිණි මාර්ගයයි. එය ඇසුරෙන් අංක **35** සහ **36** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**35.** ආරම්භක ස්ථානයට පාපැදිකරු නැවත පැමිණෙන විට දකුණුපසට හා වම්පසට හැරුණු වාර ගණන කීය ද?

(1) දකුණුපසට 1යි, වම්පසට 5යි
(2) දකුණුපසට 4යි, වම්පසට 1යි
(3) දකුණුපසට 5යි, වම්පසට 1යි


**36.** නැවත ආරම්භක ස්ථානයට පැමිණෙන විට පාපැදිකරු ගමන් කර ඇති මුළු දුර කිලෝමීටර කීය ද?

(1) 24 (2) 29 (3) 32

**37.** අමර, කමල් හා සමන් යන මිතුරන් තිදෙනාගේ නැගණියෝ දීපා, රාණි හා සීතා වෙති. අමරගේ නැගණිය වාඩි වී සිටින්නේ දීපා සමඟයි. කමල්ගේ නැගණිය දීපා නොවේ නම්, සමන්ගේ නැගණිය කවුරුන් ද?

(1) දීපා (2) රාණි (3) සීතා

**38.** A හා B භාජනවල ඇති සහල්වලින් හරි අඩක් බැගින් ඉවතට ගෙන ඒවා එම භාජන දෙකට මාරු කර දමනු ලැබේ. එවිට A භාජනයේ ඇති සහල් ප්‍රමාණය, B භාජනයේ ඇති සහල් ප්‍රමාණයට,





(1) වඩා අඩු වේ.
(2) සමාන වේ.
(3) වඩා වැඩි වේ.

**39.** රාජා ළඟ තිබූ මුදලට වඩා රුපියල් 25ක් වැඩියෙන් ආශා ළඟ තිබුණි. ආශා රුපියල් 15ක් රාජාට දුන් විට, රාජා ළඟ ඇති මුදල ආශා ළඟ ඇති මුදලට වඩා,

(1) රුපියල් පහක් වැඩි ය.
(2) රුපියල් දහයක් වැඩි ය.
(3) රුපියල් දහයක් අඩු ය.

**40.** රූපයේ දැක්වෙන්නේ වෘත්තාකාර ධාවන පථයකි. ළමයි දෙදෙනෙක් එහි A නමැති ස්ථානයෙන් එකවිට පිටත් වී එකම දෙසට ගමන් කරති. එක් ළමයකුගේ වේගය, අනෙක් ළමයාගේ වේගය මෙන් දෙගුණයක් නම්, ඔවුන් දෙදෙනා නැවත මුණගැසෙන ස්ථානය කුමක් ද?

(1) A
(2) B
(3) C




* * *

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, 2020

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යත්වාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2020

## II පත්‍රය

පැය 1 යි මිනිත්තු 15 යි.

විභාග අංකය :.................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත දැක්වෙන කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය. | V/II/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

1. පහත දැක්වෙන ඡේදය කියවන්න.

වෙල් ඉපනැල්ලේ සිටින රාජා දුටු සමන්ට දැනුණේ සතුටකි. රාජා සමඟ සෙල්ලම් කිරීමට නොඉවසිලිමත් වූ සමන් වහ වහා කුඹුර දෙසට දිව ගියේ ය. වර්ණවත් කුරුල්ලකු මෙන් අහසේ පාවෙන සරුංගලයක් දුටු සමන් ඉමහත් සතුටට පත් විය. සරුංගලයේ නූල කැඩී ඈතට යන බව තමා සමීපයට පැමිණි සමන්ට රාජා පැවසුවේ ශෝකයෙනි. අහසේ ඈතට පාවී යන සරුංගලය දෙස බලා සිටි රාජාගේ දෑස්වල කඳුළු දුටු සමන් "අපි තව සරුංගලයක් හදමු" යැයි යෝජනා කළේ ය.

- **ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

(i) සමන් කුඹුර දෙසට දිව ගියේ කුමක් සඳහා ද? ..........................................................

(ii) 'ඉක්මනින්' යන්නට අර්ථය දීමට ඡේදයේ යොදා ඇත්තේ කුමක් ද? ..............................

(iii) සමන් සරුංගලය දුටුවේ කුමක් ලෙස ද? ..........................................................

(iv) 'ශෝකය' යන්නට විරුද්ධ අර්ථයක් දැක්වෙන පදය ලියන්න. ..............................

(v) රාජාගේ සරුංගලය අහසේ ඈතට පාවී ගියේ කුමක් නිසා ද? ..............................

(vi) "අපි තව සරුංගලයක් හදමු" යැයි සමන් යෝජනා කළේ ඇයි?

..........................................................................................................

2. ප්‍රාණවාචී, ඒකවචන, අතීත කාල ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ගියේ ය. (2) දුවන්නේ ය. (3) දිළිසුණේ ය.

3. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

පුවරුවේ / කියවීමට / පුරුදු / නිර්මාණ / දැ / ඇති / වෙමු

.......................................................................................................... .

4. පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය **නිවැරදි** නම් '✓' ලකුණ ද **වැරදි** නම් '✗' ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(i) නංගී උදෑසන ම පාසලට ගියා ය. (.........)

(ii) රෑ අහසේ තරු බැබළුණේ ය. (.........)

(iii) හංසයෝ විලෙහි පීනති. (.........)

(iv) තාත්තා උදෙන් ම අවදි වූහ. (.........)

5. ගැළපෙන විරාම ලකුණු යොදන්න.

| |
|---|
| හොඳට ඇහුම්කන් දීලා කිවුව වැඩේ කරන්න පුරුදු වෙන්න ගුරුතුමිය පැවසුවා ය |

6. (i) පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කිරීමට සුදුසු වචන හිස්තැනෙහි ලියන්න.

ආඬි හත්දෙනාගේ .................................. වගේ.

(ii) පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.

නුසුදුස්සාට තනතුරු දීමෙන් අහංකාර වීම

..........................................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

**7.** පහත සඳහන් එක් එක් වාක්‍යයෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) අප රටෙහි (සෙලලමය/ශෛලමය) ප්‍රතිමා බොහෝ ඇත.

(ii) ඩෙංගු රෝගය පිළිබඳ ව පැවැත්වූ (දේශනය/දේශණය) ඉතා අගනේ ය.

**8.** පහත සඳහන් වාක්‍යය වර්තමාන කාලයට හරවා ලියන්න.

ඔවුහු සෙල්ලම් කළෝ ය.

..............................................................................................................................................

**9.** ස්ත්‍රී ලිංග පදය ලියන්න. යහළුවා : ...............................

**10.**

සමන්තැන්න විදුහල
2020.10.05

සැපවේවා!

දයාබර උචිඳු,

ඔබ අසනීප වී රෝහලේ සිටින බව අපට දැනගන්න ලැබුණා. ඒ ගැන කණගාටුයි. ඔබට දැන් තරමක් සුවය ලැබී ඇති බව ගුරුතුමී අපට පැවසුවා. පාසල් වැඩ අතපසු වීම ගැන කණගාටුවෙන්න එපා. ඔබ සනීප වී පාසල් පැමිණි පසු අපි ඔබට උදව් කරන්නම්.

ඔබට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමු!

මෙයට,
පහ ශ්‍රේණියේ යහළුවන්

(i) මෙම ලිපිය ලියා ඇත්තේ කාටද? ....................................................................................

(ii) මෙම ලිපිය ලියා ඇත්තේ කවුරුන් විසින් ද? ....................................................................


(iii) යහළුවන් ප්‍රාර්ථනා කළේ කුමක් ද? ..............................................................................

**11.** එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.

(i) Rainbow : ....................................  (ii) Daughter : ....................................


**12.** එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය, **ඉංග්‍රීසි** අකුරෙන් ම ලියන්න.

(i)



....................................

(ii)



....................................

**13.** පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) a / This / playground / is : .......................................................................... .

(ii) am / my / helping / I / mother : .................................................................. .

**14.** "වංගි" යන දෙමළ වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.


..............................................................................................................................................

[හතරවැනි පිටුව බලන්න.

**15.** පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

අත් සෝදන්න : ..............................................

**16.** ගණක රාමුවේ නිරූපිත සංඛ්‍යාව, ඉලක්කමෙන් ලියන්න.




: ..............................................

**17.** පහත දී ඇති සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

7050 : ..........................................................................................................................

**18.** පහත සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට ලියන්න.

8607 , 6078 , 8706

.................., .................., ..................

**19.**

| | | |
|---|---|---|
| 1 | | 9 |
| | 5 | |
| 13 | | 17 |

කොටුවේ ඇති සංඛ්‍යා සියල්ල ම යොදාගෙන පොදු අන්තරය 4 වන සංඛ්‍යා රටාවක් ගොඩනගන්න.

1 , ......., ......., ......., .......

**20.** එක්තරා පාසලක ගැහැනු ළමයි 1046 දෙනෙක් ද පිරිමි ළමයි 938 දෙනෙක් ද සිටිති.


(i) පාසලේ සිටින මුළු ළමයින් සංඛ්‍යාව කීය ද?

..........................................................................

(ii) එම පාසලේ පිරිමි ළමයින්ට වඩා ගැහැනු ළමයින් කොපමණ සිටිත් ද?

..........................................................................

**21.** ඉදිරියෙන් දී ඇති රූපයෙන් $\frac{3}{4}$ ක් (පැන්සලෙන් හෝ පෑනෙන්) පාට කරන්න.



**22.** පැය 24 ඔරලෝසුවේ 13 : 30 ලෙස පෙන්වන වේලාව, පැය 12 ඔරලෝසුවේ වේලාවෙන් කීය ද?

..............................................

**23.** 416, 4 න් බෙදූවිට පිළිතුර කුමක් ද? : ..................................................................

**24.** පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | මිල දී ගත් ප්‍රමාණය | කිලෝග්‍රෑම් එකක මිල | | වටිනාකම | |
|---|---|---|---|---|---|
| | | රුපියල් | සත | රුපියල් | සත |
| හාල් | 3 kg | 95 | 00 | (i) .............. | .............. |
| පරිප්පු | 500 g | (ii) .............. | .............. | 87 | 50 |
| මුළු මුදල | | | | 372 | 50 |

[පස්වැනි පිටුව බලන්න.

**25.** එක් ටැංකියක ජලය ලීටර 10 මිලිලීටර 500 ක් ද තවත් ටැංකියක ජලය ලීටර 8 මිලිලීටර 600 ක් ද ඇත. ටැංකි දෙකෙහි ජල ප්‍රමාණ අතර වෙනස කොපමණ ද?

ලීටර …………… මිලිලීටර ……………

**26.** මල්ලක හාල් 2 kg 350 g ක් තිබුණි. එයට තවත් හාල් 1 kg 750 g ක් දමන ලදි. දැන් මල්ලේ ඇති හාල්වල මුළු බර කොපමණ ද?

…………… kg …………… g

**27.** A නගරයේ සිට B නගරයට දුර 5 km 750 m වේ. B නගරයේ සිට C නගරයට දුර 7 km 500 m වේ. A නගරයේ සිට B නගරය හරහා C නගරයට ඇති මුළු දුර කොපමණ ද?


…………… km …………… m

**28.** රූපයේ දැක්වෙන ඝනවස්තුවේ නම ලියන්න.



………………………………

**29.** පැයක් තුළ මාර්ගයක ධාවනය වූ වාහන පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ.




මාර්ගයෙහි ගමන් කරන ලද මුළු වාහන සංඛ්‍යාව කීය ද? …………………

- අංක **30** සිට **59** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් **ඉරක් අඳින්න**.

**30.** 'නිදහස් අධ්‍යාපනයේ පියා' ලෙස හඳුන්වනුයේ,
  (1) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මැතිතුමා ය.
  (2) ආචාර්ය ටී.බී. ජායා මැතිතුමා ය.
  (3) ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ය.

**31.** බෝ **නොවන** රෝගයකට උදාහරණයක් වන්නේ පහත සඳහන් කුමක් ද?
  (1) කොළරාව (2) දියවැඩියාව (3) ඩෙංගු

**32.** පාද සහිත සතුන් පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
  (1) බල්ලා, ගැඩවිලා, කොකා (2) බළලා, නයා, කුකුළා (3) ගිරවා, තාරාවා, ඉබ්බා

**33.** වවුලාගෙන් මිනිසාට ඇති ප්‍රයෝජනයක් වන්නේ,
  (1) රාත්‍රි කාලයෙහි සැරිසැරීමයි. (2) ශබ්ද නිකුත් කිරීමයි.
  (3) බීජ ව්‍යාප්ත කිරීමයි.

[හයවැනි පිටුව බලන්න.


**55.** දුර දිග නොබලා සිදුකරන මිනිස් ක්‍රියාකාරකම් නිසා ආපදා සිදුවිය හැකි අවස්ථාවක් වන්නේ,
(1) අකුණු ගැසීම නිසා වගා විනාශ වීමයි. (2) සුළි සුළං හමද්දී නිවෙස් කැඩී බිඳී යාමයි.
(3) කඳුවල ඇති පස් කැපීම නිසා නාය යාම් ඇති වීමයි.

**56.** 'ඔළිඳ කෙළිය' යනු,
(1) බෙහෙත් සකසන ක්‍රමයකි.
(2) ජන ක්‍රීඩාවකි.
(3) සන්නිවේදන ක්‍රමයකි.

**57.** ශ්‍රී ලංකාවට ඒකදේශීක පක්ෂියකු සහ ඒකදේශීක ක්ෂීරපායී සතකු පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වළි කුකුළා හා දිවියා (2) වළි කුකුළා හා කළු වඳුරා
(3) හබන් කුකුළා හා යක් කටුස්සා

**58.** "රන් දැකැති ගෙන නිති සැරසෙනවා
රත්රන් පටි ඉන වට දිලිසෙනවා"
මෙය
(1) පාරු කවියකි. (2) ගොයම් කවියකි. (3) පතල් කවියකි.

**59.** රූපයේ දක්වා ඇත්තේ ජලය පුරවා ඇති බෝතලයකි. මෙහි ජලය මගින් ඇති කරන පීඩනය වැඩිම ස්ථානය කුමක් ද?




(1) A
(2) B
(3) C

**60.** "පාසල් වසා තැබූ කාලය මා ගත කළ අයුරු" යන්න මාතෘකාව කරගනිමින් වාක්‍ය **තුනක්** ලියන්න.
(සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

1. ..............................................................................

..............................................................................

2. ..............................................................................

..............................................................................

3. ..............................................................................

..............................................................................

***

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

# 3, 4, 5 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## 5 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- 5-ශ්‍රේණිය - ගණිතය
- 5-ශ්‍රේණිය - සිංහල
- 5-ශ්‍රේණිය - පරිසරය
- 5-ශ්‍රේණිය - ENGLISH
- 5-ශ්‍රේණිය - දෙමළ
- 5-ශ්‍රේණිය - විද්‍යා දැනුම

## Grade 5 - Short Notes

**Tamil Medium**

- ENV (Tamil Medium)
- Tamil Language (Tamil Medium)
- Mathematics (Tamil Medium)
- Sinhala (Tamil Medium)

## 4 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- 4-ශ්‍රේණිය - ගණිතය
- 4-ශ්‍රේණිය - සිංහල
- 4-ශ්‍රේණිය - පරිසරය
- 4-ශ්‍රේණිය - ENGLISH
- 4-ශ්‍රේණිය - දෙමළ

## Grade 4 - Short Notes

**Tamil Medium**

- ENV (Tamil Medium)
- Tamil Language (Tamil Medium)
- Mathematics (Tamil Medium)
- Grade 3, 4, 5 Short Essay (Tamil Medium)

## 3 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- 3-ශ්‍රේණිය - ගණිතය
- 3-ශ්‍රේණිය - සිංහල
- 3-ශ්‍රේණිය - පරිසරය
- 3-ශ්‍රේණිය - ENGLISH
- 3-ශ්‍රේණිය - දෙමළ

---

- Grade 3, 4, 5 Short Essay
- 3, 4, 5 -ශ්‍රේණි - රචනා හුරුව
- 3, 4, 5 -ප්‍රාථමික ශ්‍රේණි සඳහා සිංහල අත්වැළ
- ප්‍රාථමික ශ්‍රේණි සඳහා දෙමළ බසට අත්වැළ
- තේරවිලි 500
- ප්‍රස්තාව පිරුළු 500

## පෙරහුරු ප්‍රශ්න පත්‍ර කට්ටල

- 5 ශිෂ්‍යත්ව පෙරහුරු විභාග ප්‍රශ්න පත්‍ර කට්ටලය
- 4 ශිෂ්‍යත්ව පෙරහුරු විභාග ප්‍රශ්න පත්‍ර කට්ටලය
- 3 ශිෂ්‍යත්ව පෙරහුරු විභාග ප්‍රශ්න පත්‍ර කට්ටලය

## ප්‍රශ්නෝත්තර කට්ටල

- 5 ශ්‍රේණිය 1 වන වාර විභාග කට්ටලය
- 4 ශ්‍රේණිය 1 වන වාර විභාග කට්ටලය
- 3 ශ්‍රේණිය 1 වන වාර විභාග කට්ටලය

- 5 ශ්‍රේණිය 2 වන වාර විභාග කට්ටලය
- 4 ශ්‍රේණිය 2 වන වාර විභාග කට්ටලය
- 3 ශ්‍රේණිය 2 වන වාර විභාග කට්ටලය

- 5 ශ්‍රේණිය 3 වන වාර විභාග කට්ටලය
- 4 ශ්‍රේණිය 3 වන වාර විභාග කට්ටලය
- 3 ශ්‍රේණිය 3 වන වාර විභාග කට්ටලය

## 3, 4, 5 ශ්‍රේණි සඳහා පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

- ගණිතය
- සිංහල
- පරිසරය
- ENGLISH
- දෙමළ
- බුද්ධ ධර්මය

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.

PADANAMA PUBLICATION Tel: 0112794030, Fax: 0112794150 web: www.padanamapublication.lk e mail: padanamapublication@gmail.com

# තෙවන වාර ප්‍රාථමික ප්‍රශ්න පත්‍ර කට්ටල



# 5 ශිෂ්‍යත්ව පාඩමෙන් පාඩම ප්‍රශ්න පත්‍ර කට්ටල



# ශිෂ්‍යත්ව අරමුණු කරගත් කෙටි සටහන්



# තෙවන වාර 6-9 ප්‍රශ්න පත්‍ර කට්ටල



# දෙවන වාර 6-9 ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍ර කට්ටල




PADANAMA PUBLICATION

පදනම ප්‍රකාශන

විමසීම් 0779 772 226
0718 008 533

+94 71 800 8533 / +94 77 088 2228

WWW.PADANAMAPUBLICATION.LK